රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:22/93 (iv)

මගේ අංකය:-ආ/8/2/576/33
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2008 දෙසැම්බර් මස 29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන්**
**<u>පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට සහන සැලසීම.</u>**

1986.10.08 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 සහ 1993.10.01 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව වන්දි ලබා ගත් නිලධාරීන්ටද අදාලවන පරිදි රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන් පූර්ණ අබාධිත තත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අනතුරට පත්වූ දින සිට වයස අවුරුදු 55 පූර්ණවන තෙක් මුළුට හිමි වැටුප ගෙවීමට රජය තීරණය කර ඇත.

I. එම වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම

II. වයස අවුරුදු 55 දී නිලධාරියා ලබන වැටුප අනුව ගණනය කර විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම.

02 **2005.05.04 දිනැති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (III) හි සඳහන් රාජකාරි** අවස්ථාවන්හි සිදුවන හදිසි අනතුරු සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල කර ගත යුතුය. එනම් ,

- * ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී,
- * රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුවද ස්වකීය සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුලතවූ යම් ක්‍රියාවක් කිරීමේදී,
- * ස්වකීය රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්,
- * සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතු වල නිරතවීම සඳහා යන ගමනකදී හෝ සේවා ස්ථානයට ආපසු එන ගමනකදී.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රතිලාභ ලබා ගැනීමට නිලධාරියා කැමත්ත ප්‍රකාශ කරන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 සහ 22/93 හි විධිවිධාන අනුව මෙතෙක් ලබාගත් ප්‍රතිලාභ එනම් වන්දි මුදල විශ්‍රාම වැටුප සහ වන්දි විශ්‍රාම වැටුප ආපසු අයකර ගතයුතුය.

04. මෙම විධිවිධාන අනුව ප්‍රතිලාභ ලබා ගන්නා නිලධාරීන්ට 1988.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 හි විධිවිධාන අනුව වන්දි ලබා නොදිය යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය